## ලංසු ආරාධනයයි.

## ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය-කෑගල්ල

## රෝහල් වල කිළිටි රෙදි සේදීම සඳහා මිළගණන් කැඳවීම-2026 වර්ෂය

කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශය තුළ පිහිටි රෝහල් වල කිළිටි රෙදි සේදීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් 2025/12/03 දින පෙ.ව.10.30 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. 2025/11/19 දින සිට 2025/12/ 02 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි දී පෙ.ව.9.00 සිට ප.ව.2.30 දක්වා කාලය තුළදී රු.1000.00 ක මුදලක් ගෙවා ලංසු කැඳවුම් ආකෘති පත්‍ර හා ලංසු ඉදිරිපත් කළ යුතු රෝහල් පිළිබඳ විස්තර මෙම කාර්යාලයේ ගිණුම් අංශය වෙතින් ලබා ගත හැකිය.

03. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර මෙම කාර්යාලයේ www.rdhskegalle.lk යන වෙබ්අඩවිය වෙතින් ලබා ගත හැකිය.

විශේෂඥ වෛද්‍ය පී. නිදර්ශනි
විශේෂඥ වෛද්‍ය (ප්‍රජා සෞඛ්‍ය)
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කෑගල්ල

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කාර්යාලය,
කෑගල්ල.
දු.අං. 035-2222549

**කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශය තුළ පිහිටි රෝහල්වල කිළිටි රෙදි සේදීම සඳහා ප්‍රසම්පාදන කොන්දේසි - 2026 වර්ෂය**

කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශය තුළ පිහිටි පහත සඳහන් රෝහල්වල 2026/02/01 දින සිට 2027/01/31 දක්වා කාලයට කිළිටි රෙදි සේදීම සඳහා 2025/12/03 දින පෙ.ව.10.30 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීමේදී සියලුම ලංසුකරුවන් පහත වගුවේ දක්වා ඇති ලංසු සුරක්ෂණ මුදල ඇමුණුම (1) හි සඳහන් ආකෘතියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවක් වෙතින් 2026/01/01 දින දක්වා වලංගු වන පරිදි ලබා ගන්නා බැංකු සුරක්ෂණයක් ලෙසින් හෝ, **කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ** වෙත ගෙවා ලබා ගත් **සබර/මුදල්-01** ආකෘතියේ වූ කුවිතාන්සියේ පිටපතක් ප්‍රසම්පාදන මුල් අයදුම් පිටපතට අමුණා ඉදිරිපත් කල යුතුය.

03. මිළ ගණන් පිලිගත් බව දැන්වූ පසු ලංසුකරු විසින් කාර්යසාධන ඇපකරය වශයෙන් වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකමින් 5% ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවක් වෙතින් ලබා ගන්නා බැංකු සුරක්ෂණයක් ලෙසින් හෝ එම මුදල කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් සබර/මුදල් 01 කුවිතාන්සියේ පිටපතක් ඉදිරිපත් කර ගිවිසුම් අත්සන් කල යුතුය. **ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කලහොත් ඔහුගේ ලංසු සුරක්ෂණ මුදල රාජසන්තක කරනු ලැබේ.**

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතු අතර, ලංසුපත් "මුල් පිටපත" හා "දෙවන පිටපත" යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහාලිය යුතු අතර, කවර තුනෙහිම **"2026 වර්ෂය සඳහා කිළිටි රෙදි සේදීමේ ලංසුපත් කැඳවීම"** යනුවෙන් සඳහන් කර මුද්‍රා තබා 2025-12-03 දින පෙ.ව.10.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, කෑගල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අංක 08 කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කල යුතුය. මේ සමඟ අමුණා ඇති ආකෘතියෙන් පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

05. 2025/12/03 දින පෙ.ව.10.30ට කෑගල්ල නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිල කාමරයේදී ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගී විය හැකිය.

06. ලංසුපත් ඉදිරිපත් කල යුතු රෝහල් හා එම රෝහල්වල මසකට සේදිය යුතු උපරිම රෙදි ප්‍රමාණයන් පහතින් දක්වා ඇත.

| අනු අංකය | ආයතනය | සේදිය යුතු රෙදි ප්‍රමාණයන් | | | ලංසු සුරක්ෂණ මුදල |
|---|---|---|---|---|---|
| | | විශාල | මධ්‍යම | කුඩා | රුපියල් |
| 01 | මූලික රෝහල - කරවනැල්ල | 10 | 7460 | 30 | 36000.00 |
| 02 | මූලික රෝහල - මාවනැල්ල | 50 | 6780 | - | 24000.00 |
| 03 | මූලික රෝහල - වරකාපොල | 3150 | 6397 | 840 | 35000.00 |
| 04 | දිසා රෝහල - රඹුක්කන | 600 | 1510 | 440 | 11000.00 |
| 05 | දිසා රෝහල - කිතුල්ගල | 350 | 50 | 50 | 5600.00 |
| 06 | ප්‍රාදේශීය රෝහල - හිඟුරලකන්ද | 60 | 36 | 16 | 1600.00 |
| 07 | ප්‍රාදේශීය රෝහල - මහපල්ලේගම | 125 | 13 | 30 | 1300.00 |
| 08 | ප්‍රාදේශීය රෝහල - පිංදෙණිය | 152 | 17 | 25 | 2800.00 |
| 09 | ප්‍රාදේශීය රෝහල - හෙම්මාතගම | 200 | 46 | 61 | 2300.00 |
| 10 | ප්‍රාදේශීය රෝහල - අම්තිරිගල | 148 | 15 | 50 | 1600.00 |
| 11 | මානසික පුනරුත්ථාපන ඒකකය - දෙමටම්පිටිය | 100 | 20 | 40 | 4700.00 |
| 12 | ළය චිකිත්සාගාරය - කෑගල්ල | 59 | 10 | 05 | 500.00 |
| - 13 | ප්‍රාදේශීය රෝහල- අරණායක | 490 | 105 | 70 | 2300.00 |

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කෑගල්ල

වෛද්‍ය පී.නිදර්ශිනි
(ප්‍රජා සෞඛ්‍ය)
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කෑගල්ල